පාර්ලිමේන්තුවේ පුස්තකාලය
1980-12-22
කොළඹ

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 37 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 35 යි　　　　තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 37 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 47/80.

**1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 37 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 33අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— **1979 අංක 1 දරන පනතෙහි 33අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

**'පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ අරමුදල.**

33අ. (1) (මේ වගන්තියේ මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ අරමුදල" යනුවෙන් නම් කරනු ලබන අරමුදලක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) (අ) පාරිභෝගිකයන්ට කරුණු කියා දීමේ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාර්යයක් සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණයන් ;

(ආ) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කරනු ලබන සියලු දඩ මුදල් ;

(ඇ) මේ පනත යටතේ රාජසන්තක කරන ලද යම් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට පනහක් ; හා

(ඈ) සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාගත නොකරන ලද යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් ප්‍රදානයක් හෝ පරිත්‍යාගයක් වශයෙන් අරමුදලට දෙනු ලබන යම් යම් මුදල් ප්‍රමාණයන්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) පාරිභෝගික සංවිධාන ප්‍රවර්ධනය කිරීම, ඒ සංවිධානවලට ආධාර දීම හා අනුබල දීම සඳහා ද ඒ සංවිධාන පරිපාලනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද ;

2—ඒ 50780 —10,475(80/11)

(ආ) පාරිභෝගිකයන්ට කරුණු කියා දීම හා ඊට අදාළ තොරතුරු පතුරුවා හැරීම සහ කරුණු කියා දීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික යම් කාර්යයක් සඳහා ද

කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදල පරිපාලනය කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වගකිව යුතු ය.

(5) අරමුදලෙහි ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.'.